## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(4) | 3 -(2) | 4 -(1) | 5 -(3) | 6 -(4) | 7 -(4) | 8 -(3) | 9 -(2) | 10-(3) |
| 11-(4) | 12-(2) | 13-(4) | 14-(1) | 15-(3) | 16-(2) | 17-(4) | 18-(3) | 19-(2) | 20-(1) |
| 21-(2) | 22-(4) | 23-(3) | 24-(2) | 25-(3) | 26-(1) | 27-(3) | 28-(3) | 29-(3) | 30-(1) |
| 31-(4) | 32-(2) | 33-(2) | 34-(1) | 35-(3) | 36-(1) | 37-(3) | 38-(1) | 39-(1) | 40-(3) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) i. කාලය, දීපය, දේශය, කුලය, මව

ii. රම්‍ය, සුරම්‍ය, සුභ

iii. මහල්ලෙක්, ලෙඩෙක්, මළ මිනියක්, පැවිදි රුවක්

iv. "රාහුලෝ ජාතෝ, බන්ධනං ජාතං" (රාහුලයෙක් උපන්නා, බැම්මක් ඇතිවුනා)

v. කුසල් දම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

vi. පඨවි, ආපෝ, තේජෝ, වායෝ

vii. රාග චරිතය, ද්වේශ චරිතය, මෝහ චරිතය, ශ්‍රද්ධා චරිතය, බුද්ධි චරිතය, විතර්ක චරිතය

viii. රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ

ix. සමාදානය යනු කළයුතු යහපත් දේ කිරීමයි.
විරමණය යනු නොකළයුතු දේ නොකිරීමයි.

x. ප්‍රඥා භාවනාව, ත්‍රිලක්ෂණ භාවනාව, විදර්ශනා භාවනාව, විපස්සනා භාවනාව (2 x 10 = 20)

(02) i. සත් පියුම් පිපීම, සිංහ නාද පැවැත්වීම, බෝසත් උපත සිදුවූ විගස පියවර තැබීම (ල. 02)

ii. * ආවාහය සඳහා සුදුසු කුමරියක තෝරාගත් අවස්ථාවේ ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීමට සිදුවීම.
* බෝසත් උපත සිදුවී දින හතකින් මව කළුරිය කිරීම.
* පස්කම් සැප අත්හැරීමට සිදුවීම.
* යසෝදරාව, පුත් කුමරු, රජ සැප අත්හැර අභිනිෂ්ක්‍රමණය කිරීම (ල. 03)

iii. සුදුසු පරිදි ලියා ඇති උචිත පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 05)

(03) i. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්ස ච ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යසෝභි වඩ්ඪති (ල. 02)

ii. උත්සාහ වන්ත වූ, මනා සිහිය ඇති, නිවැරදි දෙය පරීක්ෂාකාරීව කරන, හික්මීමෙන් යුත් දැහැමිව ජීවත් වන තැනැත්තාගේ යසස වැඩෙන්නේ ය. (ල. 03)

iii. උත්සාහවන්ත බව, එළඹ සිටි සිහියෙන් යුතු බව, පිරිසිදුව කටයුතු කිරීම, එනම් සිතින් කයින් වචනයෙන් නිදොස් දේ කිරීම, සිතා විමසා කටයුතු කිරීම, හික්මීම, දැහැමිව ජීවත් වීම, ප්‍රමාද නොවීම යන කරුණු තුළින් ජීවිතය සාර්ථක කරගත හැකි අයුරු කරුණු තුනක්වත් ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න. (ල. 05)

(04) i. කය, වචනය සංවර කර ගැනීම (ල. 02)

ii. මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම / කීර්තිය පැතිරීම / ඕනෑම පිරිසක් මැදට නිර්භයව එළඹීමට හැකිවීම / සිහි මුලානොවී කළුරිය කිරීම / මරණින් මතු සුගතියෙහි උපත ලැබීම (ල. 03)

iii. පළමු ශික්ෂා පදය වන ප්‍රාණඝාතයෙන් වැළකීම තුළින් තමාගේ ජීවිතය ද ආරක්ෂා වේ. බියෙන් සැකයෙන් තොරව ජීවත් වීමට හැකිවේ. අන්සතුදේ සොරෙන් නොගැනීම තුළින් බියෙන් සැකයෙන් තොරව ජීවත් විය හැකිය. තුන්වන ශික්ෂා පදය වන කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම තුළින් පවුල් ජීවිත ආරක්ෂා වීම, ඒඩ්ස් ආදී සමාජ රෝග වලින් වැළකී සිටීමට ද හැකිවේ. බොරු කීමෙන් වැළකීම හේතුවෙන් විශ්වාසවන්ත පුද්ගලයෙක් බවට පත්වේ. සුරාපානයෙන් වැළකීම තුළින් සිරෝසිස් ආදී රෝගවලින් වැළකීම, මුදල් වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, පවුලේ සතුට සාමය සමගිය ඇතිවීම ආදිය හේතුවේ. සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 05)

(05) i. සමථ භාවනාව / සමාධි භාවනාව / චිත්ත භාවනාව
විදර්ශනා භාවනාව විපස්සනා භාවනාව / ප්‍රඥා භාවනාව / ත්‍රිලක්ෂණ භාවනාව (ල. 02)

ii. කල්‍යාණ මිත්‍ර ආශ්‍රය / සිල්වත් වීම / ධර්ම ශ්‍රවණය / වීර්යය (ල. 03)

iii. ලෝභ, ද්වේශ, මෝහ ආදී කෙලෙස් සිතුවිලි පාලනය වීම / ධාරණ ශක්තිය වැඩිවීම / පොතපත පාඩම් කිරීමේදී පහසුවක් දැනීම / සිතෙහි තෘප්තිමත් බවක් ඇතිවීම / අසහනය නැතිවී ප්‍රසන්න පෙනුමක් ඇතිවීම / කායික රෝග පීඩා අඩුවීම / සිත එකඟ කරගත හැකි වීම ආදී කරුණු වලින් තුනක්වත් ඇසුරින් ලියා ඇති පිළිතුරකට (ල. 05)

(06) i. මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේ ය. (ල. 02)

ii. රුවන්වැලි සෑය ඉදිකිරීම / මිරිසවැටිය ඉදිකිරීම / ලෝවාමහාපාය ඉදිකිරීම / බුදු සසුන බේරාගැනීමට කටයුතු කිරීම (ල. 03)

iii. බුදු දහමට අනුව කටයුතු කිරීම / සතුරාට වුවද ගරු කළ යුතු තැන ගරු කිරීම / යහපත් ක්‍රියා කිරීම හා කරන ලද එම යහපත් ක්‍රියා පිං පොතක ලියා තැබීම / සංඝයා වහන්සේලා කෙරේ පැවති අසීමිත ගෞරවය ආදී කරුණු ඇසුරින් ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න. (ල. 05)

(07) i. වැලිවිට සරණංකර හිමි
ගිහිකල නම කුලතුංග බණ්ඩාරයි. වයස අවුරුදු දහසයේදී මහනුවර සූරියගොඩ විහාරයේදී වැලිවිට සරණංකර නමින් පැවිදි විය. මෙකල පැවති සංස්කෘතික පරිහානිය නිසා පොත්පත් මෙන්ම ගුරුවරුන්ද සොයාගැනීමට අපහසු යුගයක ස්වෝත්සාහයෙන් අධ්‍යාපනය ලබාගනී. පිඬසිඟා වැඩම කර පින්ඩපාතය වැළඳීම නිසා පිණ්ඩපාතික සරණංකර නමින් ද, අසරණයින්ට පිහිට වූ නිසා අසරණ සරණ සරණංකර නමින් ද හැඳින්වුණි. සිල්වත් වූ පිරිස එක්කොට ''සිල්වත් සමාගම'' නමින් සංවිධානයක් ද පිහිටුවාගෙන සසුන පරිහානියෙන් නඟාසිටුවීමට කටයුතු කළේය. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේද සහය ඇතිව මෙරට උපසම්පදාව කර්මය ඇතිකිරීමට කටයුතු කළේය. සියම් මහා නිකාය නම් භික්ෂු පරපුර ඇතිවූයේ ඉන් අනතුරු ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජු සඟරජ පදවියක් ද පිරිනමා ඇත. තමාටම අවවාද පිණිස ''උඩඟු නොව මහණ'' යන වචන තුන ලියා පිවිසුම් දොරටුවෙහි අලවා තිබුණි. මුනිගුණාලංකාරය, භාරාර්ථ සංග්‍රහය, රත්නත්‍රය ප්‍රමාණ ගාථා සන්නස, සතර බණවර සන්නස යන ග්‍රන්ථ රචනා කර ඇත. ත්‍රිවිධ රත්නය පිළිබඳ අපරිමිත ශ්‍රද්ධාවෙන් යුතුවීම, ශික්ෂකාමීව හා අල්පේච්ඡ ජීවත්වීම, නිරහංකාර බව, ස්ථිර අධිෂ්ඨානය යනාදිය එම චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ වේ. (ල. 05)

ii. විපස්සනා භාවනාව
විපස්සනා භාවනාව, විදර්ශනා භාවනාව, ත්‍රිලක්ෂණ භාවනාව, ප්‍රඥා භාවනාව යනුවෙන් ද හැඳින්වේ. විපස්සනා හෙවත් විදර්ශනා යනුවෙන් හඳුන්වන්නේ යථාර්ථය මනා නුවණින් විශේෂයෙන් දැකීමයි. ලෝකය හා සත්වයා අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දැකීම මෙම භාවනාව තුළින් සිදුවන බැවින් ප්‍රඥා භාවනාව නමින් හැඳින්වේ. විපස්සනා භාවනාව වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන කිහිපයකි. අටලෝ දහමින් කම්පා නොවීම, චාම් අල්පේච්ඡ ජීවිතයක් ගත කිරීමට හැකිවීම, අනිතිමානි වීම, ආචාරශීලී වීම ආදිය ඉන් සමහරකි. (සුදුසු පරිදි ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න.) (ල. 05)

iii. පංච නීවරණ
සිත කිළිටිකරන, කුසල් සිත්වලට බාධා කරන සිතිවිලි පංච නීවරණ නම්වේ. නිවරණ ධර්ම පහකි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථිනමිද්ධ, උද්දච්ච කුක්කුච්ච, විචිකිච්ඡා යන ඒවාය. මේවා බුදු දහමේ උපමා මගින් දක්වා ඇත.
කාමච්ඡන්ද වර්ණවත් ජලයට ද, ව්‍යාපාද උතුරන ජලයට ද, ථිනමිද්ධ පාසි සහිත ජලයට ද, උද්ධච්ච කුක්කුච්ඡ කැළඹුන ජලයට ද, විචිකිච්ඡාව බොර ජලයට ද උපමා කර ඇත. මෙම සිතිවිලි නිවන ආවරණය වන බැවින් නිවන්මග අවුරා දැමීමට හේතුවන බැවින් නීවරණ නම් වේ. (ල. 05)

iv. ත්‍රිලක්ෂණය
අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යනු ත්‍රිලක්ෂණයයි. අනිත්‍යතාව යනු ලොව සියල්ල මොහොතෙන් මොහොත වෙනස් වන බවයි. ලොව සියල්ලෝම සැපයට කැමතිය. සියලු කටයුතු සිදු කරන්නේ සැප සම්පත් අපේක්ෂාවෙනි. එහෙත් සංසාරික පැවැත්ම මූලික වශයෙන්ම දුක් සහිතය. සැප යනුවෙන් සිතන සියල්ල තාවකාලිකය. අනිත්‍යය. එබැවින් දුක ඇතිවේ. නිත්‍ය වූ ස්ථිර වූ නොවෙනස්ව පවතින ආත්මයක් හෙවත් මම යයි ගත හැකි කිසිවක් නැති බැවින් ආනාත්ම නම් වේ. (ල. 05)